# ඡන්ද පැමිණිලි 400 ඉක්මවයි




■ **රවිශාන් ප්‍රනාන්දු**

පාර්ලිමේන්තු මැතිවරණයට අදාළව පැමිණිලි 401ක් ලැබී ඇති බව මැතිවරණ කොමිෂන් සභාව ඊයේ (20දා) නිකුත් කළ වාර්තාවේ සඳහන් වේ.

මෙවර මහ මැතිවරණයට අදාළ සැප්තැම්බර් 26 සිට මේ මස 19 වැනිදා දක්වා එලෙස පැමිණිලි ලැබී තිබේ.

ඒ අනුව ජාතික මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයට නීති උල්ලංඝනය කිරීම්වලට අදාළව පැමිණිලි 158ක් ලැබී ඇත. දිස්ත්‍රික් මැතිවරණ පැමිණිලි කළමනාකරණ මධ්‍යස්ථානයට ඒ සම්බන්ධ පැමිණිලි 243ක් ලැබී තිබේ.

මෙතෙක් කිසිදු ප්‍රචණ්ඩ ක්‍රියාවක් එම කොමිසමට වාර්තා වී නොමැති බව එහි දැක්වේ. ලැබී ඇති පැමිණිලි 309කට අදාළ විසඳුම් ලබාදී ඇතැයි එම වාර්තාවේ සඳහන් වේ. පැමිණිලි 92කට අදාළව ක්‍රියා කරමින් පවතින බව මැතිවරණ කොමිෂන් සභාව වැඩිදුරටත් සඳහන් කරයි.

මේ අතර පැෆ්රල් සංවිධානයට පාර්ලිමේන්තු මැතිවරණයට අදාළ වැලිගම මිදීගම තුර්කි ගම්මානයට හැරෙන මාර්ගයේදී පුද්ගලයෙක්ට අතින් පයින් හා යකඩ පොල්ලකින් පහරදී තුවාල කිරීමක් වාර්තා වී ඇති බව එහි විධායක අධ්‍යක්ෂ රෝහණ හෙට්ටිආරච්චි මහතා 'මව්බිම'ට පැවැසීය.

එම සංවිධානයට මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පැමිණිලි 08ක් පසුගිය 18 වැනිදා වන විට ලැබී තිබූ බව ඔහු කීවේය.

පැෆ්රල් සංවිධානය දිවයින පුරා දිස්ත්‍රික් නිරීක්ෂකයන් 160ක් යොදා ඇති බව හෙට්ටිආරච්චි මහතා ප්‍රකාශ කළේය.

අපේක්ෂකයන් සිදු කරන මැතිවරණ ප්‍රචාරණ වියදම් පිළිබඳ සොයා බැලීමට නිරීක්ෂකයන් 40ක් යොදා ඇති බව රෝහණ හෙට්ටිආරච්චි මහතා වැඩිදුරටත් සඳහන් කළේය.